# ඔබේ මහජන නියෝජිතයා
# නිවැරදිව තෝරාගන්නේ කෙසේද?

සැකසුම:
නීතීඥ ජගත් ලියනආරච්චි
රෝහන හෙට්ටිආරච්චි
(විධායක අධ්‍යක්ෂ - පැෆ්රල්)

2013 අගෝස්තු

පැෆ්රල්
නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ
ජනතා ක්‍රියාකාරීත්වය
12/3, රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06
දුරකථන : 011 2514441/2
ෆැක්ස් : 011 2514443
ඊමේල් : paffrel@sltnet.lk
වෙබ් අඩවිය : www.paffrel.lk

# පෙරවදන

අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාව ජනරජයකි. එමෙන්ම ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය නැතහොත් ස්වාධිපත්‍යය පුරවැසියන් සතු වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාවේ දක්වා ඇත.

මෙම පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය යන අංග 3 ඇතුලත් වේ. පාලන බලතල ජනතාවට හිමිවුවත් සියළු දෙනාටම පාලනයට හවුල්විය නොහැකි නිසා ජනතාවගේ පාලන බලතල ජනතාවගේ කැමැත්තට අනුව ක්‍රියාවට නගන්නේ රජය විසිනි.

ඒ අනුව රජය විසින් ජනතාවගේ පාලන බලතල ආයතන 3ක් ඔස්සේ ක්‍රියාවට නගයි. එනම්,

- ජනතාවගේ විධායක බලතල ජනාධිපතිතුමන් කැබිනට් මණ්ඩලය හා රාජ්‍ය නිළධාරීන් ඇතුලත්වන විධායකය හරහාද
- ජනතාවගේ ව්‍යවස්ථාදායක බලතල පාර්ලිමේන්තුව විසින්ද
- ජනතාවගේ අධිකරණ බලතල ස්වාධීන අධිකරණ විසින්ද ක්‍රියාවට නගයි. එමෙන්ම ජනමත විචාරණයකදී ජනතාව සිය ව්‍යවස්ථාදායක බලය තමන් විසින්ම ක්‍රියාවට නගනු ලබයි.

තම මූලික අයිතියක් වන ඡන්ද බලය රැක ගැනීමට නම් නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් කොන්දේසි විරහිතව සංවිධානය විය යුතු බව අපගේ විශ්වාසයයි.

මෙම පොතෙන් අප අපේක්ෂා කරන්නේ යහපත් නියෝජිතයන් පත්කර ගැනීම සඳහා ඡන්ද දායකයාට මග පෙන්වීමක් පමණි. මෙයින් කිසිදු දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට අගතියක් හෝ විශේෂ වාසියක් ඇති නොවනු ඇත.

මෙම පොත පුරවැසියන් සතු වන ස්වාධිපත්‍යය තහවුරු කර ගැනීමටත්, සුදුසු ලෙස මහජන නියෝජිතයන් තෝරා ගැනීමටත්, උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි අප විශ්වාස කරමු.

**රෝහණ හෙට්ටිආරච්චි**
**විධායක අධ්‍යක්ෂ**
**නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය**

# ඔබේ මහජන නියෝජිතයා නිවැරදිව තෝරාගන්නේ කෙසේද?

අපේ වෑයම

1931 වසරේ සිටම සර්ව ජන ඡන්ද බලය භාවිතා කරන රටක පුරවැසියන් ලෙස අපි විටෙක ආඩම්බර වෙමු. ඒ ලොව පැරණිම සර්වජන ඡන්ද බලය භාවිතා කරන රටවල් අතරට අපද එක්වන බැවිනි. එමෙන්ම ලොව බොහෝ රටවල් හා සංසන්දනය කරන විට හමුදා කුමන්ත්‍රණ හෝ වෙනත් කැරලිවලින් තොරව ඡන්ද බලයෙන් ආණ්ඩු පත්වීමේ හා පෙරලීමේ ක්‍රමයක් අඛන්ඩවම අප රටෙහි භාවිතා වෙයි. එනම් මැතිවරණ ක්‍රමවේදය අඩුපාඩු සහිතව වුවත් නිසි කලට භාවිතයට නගයි.

එසේ වුවද අප සමාජය තුළ දේශපාලඥයන් කෙරෙහි ජනතාවගේ ප්‍රසාදයක් නැත. ඔවුන් සිය පැවරුණ භූමිකාව අමතක කර දේශපාලනය ලාබ ලබන ව්‍යාපාරයක් සේ පවත්වාගෙන යන බවට බොහෝ දෙනා චෝදනා කරති. මදක් කල්පනාකර බැදුවහොත් තේරුම් යන සත්‍යය නම් අප විසින් පත් කරන දේශපාලනඥයන්ට පසුව අපම බැන වදින බැවයි.

එය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ නිරෝගී පැවැත්මට බාධාවක් වන අතරම ඡන්ද දායකයන් ලෙස අපගේ වගකීම් විරහිත බව හුවාදැක්වීමක් ද වේ.

දූෂිතයන් හෝ නොසුදුසු පුද්ගලයන් දේශපාලනයට රැගෙන නොඒමේ ප්‍රදාන වගකීම ඇත්තේ දේශපානල පක්ෂවලට නමුත් දේශපාලන පක්‍ෂ විසින් ඉදිරිපත් කරන පුද්ගලයින් අතර දූෂිතයන් සිටිනම් ඔවුන්ට මහජන නියෝජිතධූරය ලබා නොදීමේ වගකීමක් ඡන්ද දායකයන් වශයෙන් අප වෙතද පැවැරී තිබේ.

යහපත් දේශපාලන සංස්කෘතියක් උදෙසා සුදුසු මහජන නියෝජිතයන් තෝරා ගැනීමට ඡන්ද දායකයන් වෙත යම් මගපෙන්වීමක් කිරීම මෙම පොත් පිංචෙහි අපේක්‍ෂාවයි.

# ඔබේ මහජන නියෝජිතයා නිවැරදිව තෝරාගන්නේ කෙසේද?

<u>අන්තර්ගතය</u>


1. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හා ජනතා පරමාධිපත්‍යය
2. ශ්‍රී ලංකාවේ පාලන ව්‍යුහයන් හා මහජන නියෝජිතයින්ගේ කාර්යභාරය
3. මහජන නියෝජිතයා තෝරාගැනීමේදී බොහෝ දෙනෙකු සලකා බලන සාධක
4. මැතිවරණයක අපේක්ෂකයකු වීමේ නීත්‍යානුකූල නොහැකියාවන්
5. මහජන නියෝජිතයින්ට නිතර නැගෙන දෝෂාරෝපණ
6. අපේ මහජන නියෝජිතයා තුළ පැවතිය යුතු අත්‍යවශ්‍ය අංග
7. අපේ අපේක්ෂකයා ලෙස නිවැරදි අයෙකු තෝරාගැනීමට ඇති බාධක
8. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
9. ඡන්දය භාවිතා කරන ස්ථාන
10. තැපැල් ඡන්ද අයදුම් කිරීම
11. ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන යායුතු දේ
12. ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය
13. ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම
14. ආදර්ශ ඡන්ද පත්‍රිකා

# 1. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හා ජනතා පරමාධිපත්‍ය


අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාව ජනරජයකි. එමෙන්ම ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය නැතහොත් ස්වාධිපත්‍යය පුරවැසියන් සතු වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාවේ දක්වා ඇත.

මෙම පරමාධිපත්‍යයට පාලන බලතල, මානව හිමිකම් හා ඡන්ද බලය යන අංග 3 ඇතුලත් වේ. පාලන බලතල ජනතාවට හිමිවුවත් සියළු දෙනාටම පාලනයට හවුල්විය නොහැකි නිසා ජනතාවගේ පාලන බලතල ජනතාවගේ කැමැත්තට අනුව ක්‍රියාවට නගන්නේ රජය විසිනි.

ඒ අනුව රජය විසින් ජනතාවගේ පාලන බලතල ආයතන 3ක් ඔස්සේ ක්‍රියාවට නගයි. එනම්,


1. ජනතාවගේ විධායක බලතල ජනාධිපතිතුමන් කැබිනට් මණ්ඩලය හා රාජ්‍ය නිලධාරීන් ඇතුලත්වන විධායකය හරහාද
2. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලතල පාර්ලිමේන්තුව විසින්ද
3. ජනතාවගේ අධිකරණ බලතල ස්වාධීන අධිකරණ විසින්ද ක්‍රියාවට නගයි. එමෙන්ම ජනමත විචාරණයකදී ජනතාව සිය ව්‍යවස්ථාදායක බලය තමන් විසින්ම ක්‍රියාවට නගනු ලබයි.

නමුත් ජනතාවගේ ඡන්ද බලය හා මානව හිමිකම් ජනතාව විසින්ම ක්‍රියාවට නගනු ලබන අතර ඒවා පැහැර ගැනීම හෝ අන්සතු කිරීම කළ නොහැක. ඒ අනුව ජනරජයක රජයේ පාලන ආයතනවලට වඩා ජනතාව උත්තරීතරවේ. එය පහත රූප සටහනෙන් පෙන්වාදිය හැකිය.



මෙම ජනතා පරමාධිපත්‍යය නිරෝගී ලෙස ක්‍රියාත්මක වන්නේ මහජනයා විසින් සිය මහජන නියෝජිතයින් ලෙස නිවැරදි පුද්ගලයන් තෝරාපත් කරගත් විට පමණි. තම ඡන්ද අයිතිය භාවිතා කරමින් රජයේ පාලන ආයතනවලට වැරදි මහජන නියෝජිතයන් තෝරාපත් කරගත් විටෙක මෙම රූප සටහන උඩුයටිකුරු වේ.

එනම්,




එබැවින් පුරවැසියන් තම ස්වාධිපත්‍යය ආරක්ෂාකර ගැනීම සඳහා නිවැරදි මහජන නියෝජිතයන් තෝරාපත්කර ගැනීම ඉතා වැදගත්වේ.

නිදහස පැවතිය හැක්කේ ජනතාව
රට ආණ්ඩුකරන්නේ නම් පමණි.

-වුඩ්රෝ විල්සන් -

## 2. ශ්‍රී ලංකාවේ පාලන ව්‍යූහයන් හා මහජන නියෝජිතයින්ගේ කාර්යභාරය

අප ඉහතදී සාකච්ඡා කරන ලද ජනතා පරමාධිපත්‍යය යටතේ රාජ්‍ය පාලනය සඳහා මහජන නියෝජිතයන් තෝරාගැනීමේදී ශ්‍රී ලංකාවේ පවතින පාලන ව්‍යුහය අනුව පාලන ආයතන 3ක් සඳහා මහජන නියෝජනයන් පත්කරගනු ලැබේ.

එනම්,

1. පාර්ලිමේන්තුව
2. පළාත් සභා
3. පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා)

මෙම ආයතන තුනෙහි කාර්යභාරය විශාල වශයෙන් එකිනෙකට වෙනස්ය. එබැවින් ඒ සඳහා පත්කළ යුතු මහජන නියෝජිතයින්ගේ සුදුසුකම් හා දක්ෂතාද වෙනස්විය යුතුය.

විශේෂයෙන්ම පාර්ලිමේන්තුව සියළු විෂයන් පිළිබඳව ප්‍රතිපත්ති අනුමත කිරීම, රටටම බලපාන නීති සෑදීමේ කාර්යභාරය හා රාජ්‍ය මූල්‍ය පිළිබඳ අධීක්ෂණය ඉටුකරනු ලබයි. එමෙන්ම සෑම රාජ්‍ය ආයතනයක්ම පාර්ලිමේන්තුවට වගකිව යුතුවේ. එමෙන්ම කැබිනට් මණ්ඩලය සමන්විත වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්ය. එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අප විසින් තෝරාපත්කර ගත යුත්තේ ජාතික වශයෙන් සිතිය හැකි රටේ අනාගතය සකස්විය යුතු ආකාරය පිළිබඳ පුළුල් දැක්මක් ඇති අයෙකි. එවැනි අයෙකු ප්‍රාදේශිය හෝ වාර්ගිකවාද වලින් තොරව සමස්ත රටම ගැන සිතා තීරණ ගැනීමේ හැකියාවෙන් යුතු අයෙකු විය යුතුය.

පළාත් සභා විසින් ඉටුකරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවන් වෙත පවරණ ලද කාර්යයන් පමණි. නමුත් අද පවතින පළාත් සභා තම පළාත් සභා විෂය පථයේ ඇති විෂය පථයද පූර්ණ වශයෙන් භාවිතා නොකරයි. එවැනි තත්වයක් තුළ පළාත් සභා සඳහා පත්වන මහජන නියෝජිතයින් පළාත් සභා ක්‍රමය හා ව්‍යවස්ථාපිත බලතල පිළිබඳ නිවැරදි දැනීමක්, දැක්මක් හා විශ්වාසයක් ඇති අය විය යුතුය. පළාත් සභා මහජන නියෝජතයකුගේ කාර්යභාරය නිවැදිව ඉටුකළ හැක්කේ එවැනි අයෙකුටය.

ප්‍රාදේශීය සභා, නගර සභා හා මහ නගර සභායන පළාත් පාලන ආයතනවල කාර්ය භාරය ඉහත කී ආයතන දෙකටම වඩා සුවිශේෂය.

පළාත් පාලන ආයතනවල ප්‍රධාන අරමුණු වනුයේ ප්‍රාදේශීය අවශ්‍යතාවයන් සමග කටයුතු කිරීම, රජයේ සමහර ආයතනවල අනු නියෝජිත ආයතනයන් ලෙස ක්‍රියාත්මක වීම හා ප්‍රාදේශීය සංවර්ධනයයි. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රදේශීය සභා වෙත පහත කාර්යයන් පැවරී ඇත.

ඒ අතුරින් ප්‍රාදේශීය සභාවට අයිති පරිපාලන හා සංවර්ධන වැඩවලට ජන සහභාගීත්වය ලබාගැනීම, මහජන සෞඛ්‍යය, පොදු මහජන සේවා, මංවාවක් නඩත්තුව හා සංවර්ධනය, බලපත්‍ර ගාස්තු අයකිරීම, බදු අයකිරීම, පුණ්‍යාධාර දීම, තොටුපලවල් පිහිටු වීම, ආගමික සංස්කෘතික උත්සව සංවිධානය, පානීය ජල සැපසුම, ප්‍රදේශයේ පදිංචිකරුවන්ට රැකියා වැඩ පිළිවෙලවල් සකස් කිරීම ප්‍රධාන වේ.

මේ අනුව පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයින් තෝරා ගැනීමේදී, මෙම කාර්යයන් පිළිබඳව අවබෝධයක් ඇති හා අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ ප්‍රාදේශීය අවශ්‍යතා හදුනාගත් පුද්ගලයින් ඒ සඳහා තෝරා ගැනීමේ වගකීම ඡන්දදායකයින් සතුය.

අන් අයට ඉටු නොවන යුක්තිය
අපටද ඉටු නොවේ.

-වුඩ්රෝ විල්සන් -

## 3. මහජන නියෝජිතයා තෝරාගැනීමේදී බොහෝ දෙනෙකු සලකා බලන සාධක

- අපේ පක්ෂයේ කෙනෙක්ද
- අපේ ජනවර්ගයේ කෙනෙක්ද
- අපේ කුලයේ කෙනෙක්ද
- මට/දරුවාට/ඥාතියාට රැකියාවක් ගන්න පුළුවන් වෙයිද
- දරුවා පාසැලට දාගන්න පුළුවන්වෙයිද
- අදුරන කෙනෙක්ද
- ප්‍රසිද්ධ කෙනෙක්ද
- බය නැතිව කථා කරන ඉදිරිපත්වෙන කෙනෙක්ද
- පක්ෂයේ නායකයා සමග හිතවත්කම් තියෙන කෙනෙක්ද
- මේ වේලාවෙ මෙයත් එක්ක හිටියොත් ප්‍රයෝජන ගන්න පුළුවන් වෙයිද

නමුත් මෙවැනි සාධක මත තම නියෝජිතයා තෝරාගැනීම තුළින් දේශපාලනයට නුසුදුසු පුද්ගලයන් මහජන නියෝජිතයන් ලෙස පත්වීමේ අනතුරක් නිර්මාණය වන අතර කෙටි කාලීන හා ආත්මාර්ථකාමී අරමුණු ඉටුකරගැනීමේ දේශපාලන සංස්කෘතියක්ද නිර්මාණයවේ. මෙවැනි දේශපාලන සංස්කෘතියක් තුළ යහපත් දේශපාලනඥයින්ට බලය ලබාගැනීමේ නොහැකියාවක් හා දුෂ්කරතාවයක් නිර්මාණය වන අතර, ඒ තුළින් දේශපාලනයේ දූෂිතබව ක්‍රමයෙන් වර්ධනයවේ.

**ඔබ ප්‍රකාශ කරන දේ සමග මම එකග නොවෙමි එහෙත් එසේ ප්‍රකාශ කිරීමට ඔබට ඇති අයිතිවාසිකම දිවිහිමියෙන් ආරක්ෂා කරමි.**

**-වෝල්ටෙයාර්-**

## 4. මැතිවරණයක අපේක්ෂකයකුවීමේ නීත්‍යානුකූල නොහැකියාවන්

ලංකාවේ පවතින මැතිවරණ අතරින් මහජන නියෝජිතයන් තොරා ගනු ලබන්නේ පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම් පළාත් පාලන ඡන්ද විමසීම් හා ජනාධිපතිවරණ වලදීය. ජනාධිපතිවරණ වලදි තෝරාපත් කරන ලබන්නේ එක් නියෝජිතයෙකු පමණි. එබැවින් අනෙක් මැතිවරණ සඳහා වන ව්‍යවස්ථාපිත නුසුදුසුකම් ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඒ ඒ මැතිවරණ පනත් වල සඳහන් පරිදි පෙළ ගැස්විය හැකිය.

<u>I.පාර්ලිමේන්තු මංත්‍රීවරයකු ලෙස තෝරාපත් කරගනු ලැබීමට නුසුදුසුකම්</u>
(ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 91 ව්‍යවස්ථාව)

1. මැතිවරණ කොට්ඨාශ එකකට වැඩි ගණනකට නාමයෝජනා ඉදිරිපත් කර තිබීම.
2. යම් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකින් නාම යෝජනා ඉදිරිපත් කර තිබීම.
3. රජයේ නිලධාරියෙකු ලෙස ධූරය දරමින් සිටීම.
4. ජනාධිපතිධූරය දරමින් සිටීම.
5. රාජ්‍ය සංස්ථාවක නිළධාරියෙක් ලෙස ධූරයක් දරමින් සිටීම.
6. ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සාමාජිකයකු ලෙස සිටීම.
7. පොලිස් නිලධාරියෙකු
8. රජය සමග හෝ රාජ්‍ය සංස්ථාවක් සමග යම් ගිවිසුමකට ඇතුලත්ව සිටීම.
9. වස්තු භංගත්වයට පත් අයෙකු
10. මන්ත්‍රිවරයකුව සිට අල්ලස් ලබාගෙන ඇති බවට තීරණය කළ අයෙකු
11. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවීම.
12. වයස අවුරුදු 18 සම්පූර්ණකර නොතිබීම.
13. වසර දෙකකට වඩා වැඩි සිරදඬුවමක් නියමවී තිබීම (වසර 7ක කාලයක් තුළ)

II.පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස පත්වීමට නුසුදුසුකම්
(1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 වන වගන්තිය)

1. ඉහතකී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්කිරීමට ඇති සියළු නුසුදුසුකම් (1හා 2 හැර)
2. පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස පත්වීමේ ඇති නුසුදුසුකමක් තිබීම.
3. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු
4. වෙනත් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා එකකට වැඩි ගණනකට නාමයෝජනා ඉදිරිපත් කර ඇති අයෙකු.
5. යම් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකින් නාම යෝජනා ඉදිරිපත් කර තිබීම.

III.පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු ලෙස පත්වීමේ නුසුදුසුකම්
(පළාත් පාලන මැතිවරණ පනතේ 9 වන වගන්තිය)

1. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවීම
2. වයස අවුරුදු 18ට අඩු අයෙකුවීම
3. රජයේ සේවකයකු
4. සංස්ථා සේවකයකු
5. සන්නද්ධ හමුදා සාමාජිකයකු
6. පොලිස් නිලධාරියකු
7. අධිකරණ නිලධාරියකු
8. වෙනත් පළාත් පාලන ආයතනයක සභිකයෙකු
9. ඡන්ද දිනයට වසරක් ඇතුලත අදාල පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටීම
10. එම පළාත් පාලන ආයතනයක සමග ගිවිසුමක් පැවතීම
11. සිහිවිකල් පුද්ගයකු
12. වස්තු භංගත්වයට පත්වූ අයෙකු
13. දොළොස් මාසයකට වඩා වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඩුවම් ලැබිය යුතු දඩුවමක් විදිමින් සිටීම හෝ මරණ දඩුවමකට නියමවී සිරදඩුවම් විදිමින් සිටීම

## 5. මහජන නියෝජිතයින්ට නිතර නැගෙන දෝෂාරෝපණ

- පගාකාරයා
- කොන්ත්‍රාත්වලින් හම්බකරනවා
- සල්ලි අරන් පැත්ත මාරුකරනවා
- පොලිසියේ රාජකාරිවලට බාධා කරනවා
- රජයේ සම්පත් තම දේශපාලන හා පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නවා
- තමන්ගේ පවුලේ අයට අයුතු ලෙස වාසි සලසනවා
- ඡන්දෙන් පස්සෙ පොරොන්දු කඩකරනවා
- දේශපාලන බලය භාවිතා කරමින් සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙනවා

ඔබේ වටිනා ඡන්දයෙන් පත්වූ මහජන නියෝජිතයාටත් මෙවැනි චෝදනා නැගෙන්නේදැයි පරීක්ෂාකාරී වන්න. එම චෝදනා සැබෑනම් ඊළඟ මැතිවරණයයේදී එවැනි චෝදනා වලට ලක් නොවන අපේක්ෂකයෙකු තෝරාගන්න.

අප වඩාත් සංතාපයට පත්වන්නේ
අපේ පරපුරේ කුරිරු මිනිසුන්ගේ දුෂ්ඨ
ක්‍රියාගැන නොව යහපත් මිනිසුන්ගේ
බලවත් නිශ්ෂබ්දතාවය ගැනයි.

-මාටින් ලූතර් කිං -

## 6. අපේ මහජන නියෝජිතයා තුළ පැවතිය යුතු අත්‍යවශ්‍ය අංග

### 1. අවංකවිය යුතුය.

අපේ මහජන නියෝජිතයා සැබවින්ම අවංක අයෙකු විය යුතු අතර, දේශපාලනයේ නිරත වීම තුළින් රටේ සංවර්ධනය හා උන්නතිය පිළිබඳව උනන්දු වන්නෙකු විය යුතුය. එසේ නොමැතිව දේශපාලනය තුළින් තම පෞද්ගලික ආර්ථික ලාභ අපේක්ෂාවන් වෙනුවෙන් කටයුතු කරන අයෙකු නොවිය යුතුය. එවැනි අවංක පුද්ලයකු සැම විටම පවතින මැතිවරණ නීතිවලට අනුකූලව නාමයෝජනා ඉදිරපත් කරන විට තමන්ගේ හා තම පවුලේ අයගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදෙන ලැබේ. අපේ අපේක්ෂකයා අවංකවම දේශපාලනයේ යෙදෙනවාද, නැතහොත් ඔහු දේශපාලනය තුළින් ආර්ථික ලාභ ලබනවාද යන්න තේරුම් ගැනීම ඡන්ද දායකයන්ට වැඩි අපහසුවක් නැත. දේශපාලනය පිවිසීමෙන් පසු ඔහු සාධාරණව විස්තර කර නොහැකි ලෙස ධනවත් වී ඇත්නම් ඔහු අවංක දේශපාලනඥයකු නොවේ. එවැනි අය අපගේ මහජන නියෝජිතයා ලෙස තෝරා නොගත යුතුය.

### 2. නීති විරෝධී හෝ සමාජ විරෝධී ලෙස ආදායම් ඉපයූ පුද්ගලයකු නොවිය යුතුය.

ඉතා පැරණි සංස්කෘතියකට උරුමකම් කියන ශ්‍රී ලාංකික සමාජය තුළ යහපත් ව්‍යාපාර මොනවාද සමාජ විරෝධී ව්‍යාපාර මොනවාද යන්න මැනවින් අර්ථ නිරූපනය වී ඇත. සාමාජ විරෝධී ව්‍යාපාරයන්හි නියුක්තවන අයෙකු අප සලකන්නේ ද්‍රෝහියෙකු ලෙසය. එබැවින් එවැනි ද්‍රෝහියෙකු තම මහජන නියෝජිතයා ලෙස තෝරා නොගත යුතුය. එසේ වූවහොත් සිදුවන්නේ තම දේශපාලන බලයද යොදාගෙන ඔහු සමාජ විරෝධී ක්‍රියාවන්හි වඩාත් වේගවත් කිරීම තුළින් අප සමාජය තවදුරටත් පිරිහීමට ලක් කිරීමය.

### 3. ඔබට සමීප විය හැකි ඔබගේ හා ප්‍රදේශයේ අවශ්‍යතා හඳුනාගත් අයෙකු විය යුතුය.

මහජන නියෝජිතයා සැබවින්ම අපගේ අභිලාශයන් නියෝජනය කරන්නෙකු විය යුතුය. එබැවින් ඔහු අප ප්‍රදේශයේ අවශ්‍යතා හොඳින් හඳුනාගත් අයෙකු විය යුතුය. එමෙන්ම අපගේ හඬට කන්දෙන හා ගැටලු තේරුම් ගැනීමට උත්සාහ දරන අයෙකු විය යුතුය. එමෙන්ම ගැටලු සඳහා හේතු දක්වන්නෙකු නොව විසඳුම් හා විකල්ප සහිත අයෙකු විය යුතුය.

**4.** **යහපාලනය හා නීතියේ ආධිපත්‍යය පිළිබඳව ගරුකිරීමක් ඇති අයෙකු විය යුතුය.**

බොහෝ දේශපාලනඥයන් නීතිය අතට ගැනීම හා නීතිය නොතකා කටයුතු කරන අවස්ථා දක්නට ලැබේ. මෙම තත්ත්වය රටකට ඉතාම අයහපත් ප්‍රතිඵල උදාකරයි. එබැවින් අප තෝරා ගන්නා මහජන නියෝජිතයා, නීතියේ ආධිපත්‍යයට ගරුකරන පුද්ගලයකු විය යුතුය. ඔහු නීතිය ක්‍රියාවේ නැගීමට බාධාවන් සිදුකරන පුද්ගලයකු නොවිය යුතුය. එමෙන්ම තීරණ ගැනීමේදී හා සැලසුම් සකස් කිරීමේදී යහපාලන මූලධර්ම භාවිතා කරමින් සාමූහික හා සහභගීත්වය ක්‍රමවේදයන් භාවිතා කරන්නෙකු විය යුතුය. එමෙන්ම මානව ගරුත්වය සහිත පුද්ගලයකු විය යුතුය.

**5.** **දේශපාලන අවබෝධයක් හා දක්මක් ඇති අයෙකු විය යුතුය.**

අපගේ මහජන නියෝජිතයාට දේශපාලන කටයුතු පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ඇති අයෙකු විය යුතුය. ඔහු පවුලේ දේශපාලන උරුමයක් නොව තමා දන්නා දේශපාලනයක් ඉදිරියට ගෙන යන පුද්ගලයකු විය යුතුය. එවැනි පුද්ගලයකු ජයග්‍රණයෙන් පසු පාක්ෂිකයින් අතරමංකර පක්ෂ මාරුකරන්නේ නැත. එමෙන්ම ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලබා තිබීම ප්‍රතිපත්ති සම්පාදකයෙකුට දිගු ගමනක් යාමට ඉතාමත් අවශ්‍යය. එබැවින් අප මහජන නියෝජිතයාගේ අධ්‍යාපන පසුබිම ගැනද අප සැලකිලිමත් විය යුතුය.

**6.** **අල්ලස් හෝ දූෂණ චෝදනා නොලැබූවකු විය යුතුය.**

සමහර දේශපාලඥයින් විශේෂයෙන් බලයේ සිටින දේශපාලඥයන් රැකියාදීම, කොන්ත්‍රාත් ලබාදීම වැනි කරුණු සඳහා අතයට ගණුදෙනු කරන බව ප්‍රචලිතය. එවැනි මහජන නියෝජිතයින් නිසා මහජන මුදල් විශාල ලෙස විනාශ වන අතර අප අපේක්ෂා කරන සංවර්ධන ඉලක්ක කරා යාමට බාධාවන් ඇතිවේ. එබැවින් එවැනි දේශපාලඥයන් හා දේශපාලනයන්ගේ භූමිකාව හමාර කිරීමේ මහජන සේවය ඇත්තේ ඡන්ද දායකයින් අතය.

**7.** **වාර්ගික, ආගමික හා භාෂා විවිධත්වය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.**

ලාංකීය සමාජය බහු වාර්ගික බහු ආගමික හා බහු භාෂා භාවිත සමාජයයි. අපගේ මහජන නියෝජිතයාට මෙම තත්වයන් පිළිබඳ අවබෝධයක් හා පිළිග ැනීමක් තිබිය යුතුය. තීරණ ගැනීමේදී හා සැලසුම් කිරීමේදී එහි නිවැරදිබවට හා ප්‍රායෝගික බවට මෙම දැනුම හා සංවේදීතාව ඉතාමත් වැදගත්වේ.

**8.** **අභියෝග ඉදිරියේ නොසැලෙන පුද්ගලයකු විය යුතුය.**

අපගේ මහජන නියෝජිතයා සැබවින්ම පරමාදර්ශී පුද්ගලයකු විය යුතුය. නිවැරදි වෙනුවෙන් නොබියව පෙනී සිටින හා අභියෝග හමුවේ නොසැලෙන පුද්ගලයකු විය යුතුය. එමෙන්ම තම ප්‍රතිපත්ති වෙනුවෙන් කැපකිරීමක් සිදුකිරීමට හැකි හා පෞද්ගලිකත්වය නොව සමාජ අභිමාතාර්ථයක් වෙනුවෙන් තම ජීවිතය කැපකර ඇති අයෙකු විය යුතුය. එමෙන්ම නිර්මාණාත්මක අදහස් ඇති බව මෙන්ම අන්මතවලට ගරු කිරීම හා ඉවසීමද යහපත් මහජන නියෝජිතයකුට අවශ්‍යය.

**9.** **තරුණ හා කාන්තා නියෝජනය.**

අප දේශපාලන නියෝජිතයන් අතර තරුණ නියෝජනය හා කාන්තා නියෝජනය කණගාටුදායක ලෙස පහළ ගොස් ඇත. එබැවින් අපගේ මහජන නියෝජිතයා තෝරාගැනීමේදී, ඒ අතරට තරුණ හා කාන්තා නියෝජනයක් ද ඇතුලත්කර ගැනීම ඉතාමත්ම වැදගත්ය.

ආණ්ඩුවක් රඳාපවතින තිරසාර කුලුන
වන්නේ යුක්තිය ඉටුකරන ආකාරයයි.

-ජෝජ් වොෂිංටන් -

## 7. අපේ අපේක්ෂකයා ලෙස නිවැරදි අයෙකු තෝරාගැනීමට ඇති බාධක

I. අපගේ අපේක්ෂකයා වශයෙන් තෝරාගනීමට සිදුවන්නේ, වඩා සුදුසු පුද්ගලයෙකු නොව දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ඉදිපත් කරනු ලබන ලැයිස්තුවේ සදහන් අපේක්ෂකයින් අතරින් කෙනෙකි.

II. වර්තමාන මැතිවරණ ක්‍රමය තුළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් යහපත් අපේක්ෂකයකුට වියදම් කිරීමට මුදල් නොමැති නම් ජනතාව අතරට යාම දුෂ්කර කාර්යයකි.

III. මැතිවරණ ක්‍රමය හා පොදුවේ දේශපාලනය කෙරෙහි පවතින කලකිරීම නිසා යහපත් හා දක්ෂ පුද්ගයන් දේශපාලය කෙරෙහි නැඹුරු වීම අධෛර්යය කරයි.

IV. ජනමාධ්‍ය ආකර්ෂණය වන්නේ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ පිළිබඳව ප්‍රචාරය ලබාදෙනවාට වඩා, බාල හා ජනප්‍රිය කථාවලටය.

මෙම නිසා අප විසින් අපගේ මහජන නියෝජිතයා තෝරා ගැනීමේදී වඩාත්ම සැලකිලිමත් විය යුතුය. විශේෂයෙන් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන නුසුදුසු පුද්ගලයන්ට මනාප ලබා නොදීම මගින් නුසුදුසු පුද්ගලයන්ට නාම යෝජනා ලබාදීම අධෛර්යය කිරීමට ඡන්දදායකයන් ලෙස අපහට ඇති බලය හා වගකීම මෙහිදී අප නිසිලෙස හදුනාගත යුතුය.

මුලදී සාකච්ඡා කරන ලද ජනතා පරමාධිපත්‍යය සංකල්පය නිවැරදිව ලෙස හා නිරෝගී ලෙස පවත්වාගෙන යාමේ වැඩි වගකීමක් ඡන්දදායකයන් වෙත පැවරී ඇති බව මේ අනුව පැහැදිලිය. රටක යහපාලනය හා නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සඳහා මෙම ජනතා පරමාධිපතයේ නිරෝගී ක්‍රියාකාරීත්වය බෙහෙවින්ම අවශ්‍යය.

එබැවින් දේශපාලඥයන්ට දෝෂාරෝපණය කරමින් සිටිනවාට වඩා ඡන්ද දායකයන්ට ලැබෙන අවස්ථාවන්වලදී ඥානාන්විත ලෙස ඡන්දය හා මනාපය භාවිතා කරමින් යහපත් දේශපාඥයන් තෝරාගැනීමට පියවර ගන්නේ නම්, අපේ රට මෙයට වඩා සුන්දර රටක් බවට පත්වනු ඇත.

ඔබ සමාජය තුළ ඇති කිරීමට අපේක්ෂිත
වෙනස ඇරඹිය යුත්තේ ඔබ තුළින්මය.

## 8. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා ගැනීමට පහත මූලික අවශ්‍යතා සපුරාලිය යුතුය.

1. ශ්‍රී ලාංකික පුරවැසියකුවීම.
2. වයස අවුරුදු 18 සම්පූර්ණකර තිබීම,
3. අදාල වසරේ අදාලඡන්ද කොට්ඨාශයට අයත් ඡන්ද නාම ලේඛනයෙහි නම ලියාපදිංචි වී තිබීම.

* නමුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 89 ව්‍යවස්ථාවේ සදහන් යම් නුසුදුසුකමකට ලක්වුවහොත් ඡන්ද බලය අහිමි වී යයි.

## 9. ඡන්දය භාවිතා කරන ස්ථාන

ඡන්දය භාවිතා කලහැක්කේ ඡන්ද තමාගේ ඡන්දය ලියාපදිංචි කර අති ඡන්ද මධ්‍යස්ථානයකදී පමණි,වර්තමාන නීතියට අනුව ඡන්ද මධ්‍යස්ථාන වර්ග 2ක් පවතී

1. තැපැල් ඡන්ද මධ්‍යස්ථාන
2. ඡන්දය දිනයේ පවත්වනු ලබන ඡන්ද මධ්‍යස්ථාන

තැපැල් ඡන්දය මධ්‍යස්ථා ක්‍රියාත්මක වන්නේ ඡන්දයට සති කිහිපයකට කලිනි.එවැනි තැපැල් ඡන්ද මධ්‍යස්ථානවලදී ඡන්දය භාවිතා කල හැක්කේ තැපැල් ඡන්දය ඉල්ලුම්කර අනුමතවූ ඡන්ද දායකයින් සදහා පමණි.

## 10. තැපැල් ඡන්ද අයදුම් කිරීම

තැපැල් ඡන්දය අයදුම් කිරීම සඳහා පහත පුද්ගලයන් සුදුසුකම් ලබති.

- ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයන්
- සන්නද්ධ සේවාවන්හි සාමාජිකයන්
- දුම්රිය හෝ ලංකා ගමනාගමන මණ්ඩලය වැනි සේවාවන්හි නියුක්ත විම නිසා මැතිවරණ දිනයේදී නියමිත ඡන්ද පොලෙහිදි ඡන්දය ප්‍රකාශ කිරිමට නොහැකි වන්නන්.

- ඡන්ද විමසීම් පවත්වන දිනයේදී ඡන්ද විමසීම් හා සම්බන්ධ කාර්යයන් සඳහා තමා සේවයේ නියුක්ත කිරීමට ඉඩ ඇතිබව අදහස් කරන රජයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් සේවයේ හෝ වෙනත් නිළධරයන්.
- වෙනත් යම් පරිපාලන දිස්ත්‍රික්කයක තම අපේක්ෂකත්වය හෝ තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහිදි පෞද්ගලිකව ඡන්දය දීමට නොහැකිවන අපේක්ෂකයකු.

අනෙකුත් සියළුම නියමිත ඡන්ද දායකයින් මැතිවරණදිනයේ පෙරවරු 7.00 හා පස්වරු 4.00 අතර කාලය තුලදී තමන්ට අදාල ඡන්දපොලට තමන්ම ගොස් ඡන්දය ප්‍රකාශ කල යුතුය.

## 11. ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන යායුතු දේ.

1. අනන්‍යතාවය හඳුනාගැනීම අත්‍යවශ්‍යතාවක් වන බැවින් පහත සඳහන් හැදුනුම්පත් අතරින් එකක් අනිවාර්යෙන්ම රැගෙන යායුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
2. වලංගු ගමන් බලපත්‍රය
3. වලංගු රියැදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5. වැඩිහිටි හැඳුනුම්පත
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පූජ්‍ය / පූජක පක්ෂය සඳහා නිකුත් කර ඇති හැඳුනුම්පත
7. 2011 පළාත් පාලන ඡන්දවිමසීම සදහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලදුව ග්‍රාම නිළධාරී හරහා යාවත්කලීන කරන ලද හැදුම්පත් (2013 වසරෙන් පසුව මෙය වෙනස්විය හැකිය)
8. මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත

2. තමන්වෙත තැපැල් මගින් ලැබී ඇති, නිළඡන්ද දැන්වීම (මෙම ඡන්ද දැන්වීම නොමැති වුවද ඡන්ද නාමලේඛනයේ නම තිබේනම් ඡන්දය භාවිතා කිරීමට ඉඩ ලබාදෙන නමුත්, දැන්වීම තිබේනම් ඡන්දපොලේදී අපහසුතාවලට ලක්නොවේ.

## 12. ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය

- ඡන්ද ස්ථානාධිපති විසින් සකස් කර ඇති ආවෘත ස්ථානයක ඡන්දය ප්‍රකාශ කළ යුතුය.
- ඡන්ද දායකයා විසින් ලකුණු කළ ඡන්ද පත්‍රිකාව තමාම ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතුය.
- යම් ඡන්ද දායකයකුට ඡන්දය දෙන ආකාරය ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්ටද පෙනෙන සේ පැහැදිළි කිරීම ස්ථානාධි පතිවරයාට හෝ ඔහුගේ නියෝජිතයෙකුට කළ හැකිය. නමුත් මෙහිදී යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මග පෙන්වීමක් නොකළ යුතුය.
- අන්ධ භාවය හෝ යම් විශේෂ අවශ්‍යතා සහිත නිසා තමාටම ඡන්දය සලකුණු කිරීමට අපොහොසත් වන අයෙකුට ඡන්ද ස්ථානාධිපති හෝ ඔහුගේ නිළධාරියකු විසින් අදාල ඡන්ද දායකයාගේ උපදෙස් මත ඡන්දය ලකුණු කර පෙට්ටිය තුළට බහාලිය හැකිය. නැතහොත් ස්ථානාධිපතිගේ අවසරය මත එම ඡන්ද දායකයා කැටුව එන තැනැත්තෙකුට ඡන්ද දායකයාගේ උපදෙස් මත ඡන්දය ලකුණු කර පෙට්ටිය තුළට බහාලිය හැකිය.
- ඡන්දය භාවිතා කිරිමේදී අනවධානය නිසා වැරදීමක් වුව හොත් එය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කර ඔහු සෑහීමකට පත් වුවහොත් නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කල හැකිය.
- අදාල ඡන්ද දායකයාගේ ඡන්දය වෙනත් අයෙකු භාවිතා කර ඇති විටක අදාල ඡන්ද දායකයා වෙත ද්විත්ව ඡන්ද පත්‍රිකාවක් ලබා දෙනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකාව වෙනත් වර්ණයකින් යුක්ත අතර එය ලබා දීමට පෙර ප්‍රකාශයකට අත්සන් ගනු ලබයි. එසේම ඔහුගේ නම ද්විත්ව ඡන්ද ලේඛනයට ඇතුළත් කළ යුතුය.

## 13. ඡන්ද පත්‍රිකාව සලකුණුකරන ආකාරය.

1. තමන් කැමති දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම ඉදිරියෙන් ඡන්දය සලකුණු කලයුතුය. දේශපාලන පක්ෂ එකකට වඩ ඡන්දය ප්‍රකාශ කිරීම ඡන්දය අවලංගුවීමට හේතුවකි.

2. පාර්ලිමේන්තු මහ මැතිවරණයකදී හා පළාත් සභා මැතිවරණයකදී නම් තමන් කැමති අපේක්ෂකයින් එක් අයෙකුට දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට මනාපය ප්‍රකාශ කලහැකි අතර, එකී අපේෂකයාට අදාල මනාප අංකය මත සලකුණු කිරීම මගින් මනාපය ලකුණු කළ හැකිය.

3. පළාත් පාලන මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමක් මිස මනාප ලකුණු කිරීමක් නව සංශෝධිත නීතියට අනුව සිදු නොවේ.

මෙහිදී ඡන්ද මධ්‍යස්ථානය විසින් සපයනු ලබන පෑන පමණක් භාවිතා කළ යුතුය.

## 14. ආදර්ශ ඡන්ද පත්‍රිකා

1. පාර්ලිමේන්තු මහ මැතිවරණය හා පළාත් සභා ඡන්ද විමසීම සදහා භාවිතා වන ඡන්ද පත්‍රිකා ආකෘතිය

මැතිවරණයේ / ඡන්ද විමසීමේ නම

උප පත්‍රිකාවේ අංකය

| | |
|---|---|
| ඒ, පක්ෂය | |
| බී.පක්ෂය | |
| සී.පක්ෂය | |
| ස්වාධීන කණ්ඩායම් 1 | |
| ස්වාධීන කණ්ඩායම් 2 | |
| ස්වාධීන කණ්ඩායම් 3 | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |

2. පළාත් පාලන ඡන්ද විමසීම් සදහා ඉදිරියේදී භාවිතා වියහැකි ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය

(පළාත් පාලන ඡන්ද විමසීම් පනත 2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධනය වූ අතර ඒ යටතේ මෙතෙක් ඡන්ද විමසීම් පවත්වා නැත. ඉහත කී පනතේ තුන්වන උපලේඛනය අනුව මෙය සකස්කර ඇත.)

ඡන්ද විමසීමේ නම

උප පත්‍රිකාවේ අංකය

| | | |
|---|---|---|
| ඒ, පක්ෂය | ඡන්ද සලකුණ | |
| බී.පක්ෂය | ඡන්ද සලකුණ | |
| සී.පක්ෂය | ඡන්ද සලකුණ | |
| ස්වාධීන කණ්ඩායම් 1 | ඡන්ද සලකුණ | |
| ස්වාධීන කණ්ඩායම් 2 | ඡන්ද සලකුණ | |
| ස්වාධීන කණ්ඩායම් 3 | ඡන්ද සලකුණ | |